රුහුණ විශ්වවිද්‍යාලය

2016/2017 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි - 4000 ස්ථලය
පළමු සමාසික පරීක්ෂණය - 2017 ඔක්තෝබර්/නොවැම්බර්

BCU 41623 - බුදුසමය හා ලෝක ආගම්

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

කාලය : පැය 03

---

01. පංචවිධ සංකල්පය කෙරෙහි අවධානය යොමු කරමින් කොන්ෆියුසියස් ආගමේ (Confucianism) සදාචාර ඉගැන්වීම් ගෙනහැර දක්වන්න.

02. "සතෝරි" (Satori) නම් ලෝකය පිළිබඳ නව දෘෂ්ටිකෝණයක් ඇතිකර ගැනීම යි." සෙන් බෞද්ධ ඉගැන්වීම් මගින් 'සතෝරි' කරා ප්‍රවේශ වන ආකාරය පෙන්වා දෙන්න.

03. "තන්ත්‍රයානි බුදුසමය (Tantric Buddhism) නියෝජනය කරන්නේ මූලික බුදුසමයේ පිරිහුණු අවස්ථාවකි." මෙම මතය සනාථ කළ හැකි ද? ඔබේ අදහස් දක්වන්න.

04. දේව නිර්මාණවාදය හා ඒ පිළිබඳව ඉදිරිපත් කළ තර්ක විචාරයට ලක් කරන්න.

05. ආගමික අනුභූතිය (Religious Experience) හඳුන්වා දී නිවණ ගුඪ අනුභූතියක් දැයි පරීක්ෂා කරන්න.

06. නව ආගම් බිහිවීමට හේතු වූ කාරණා දක්වා ක්‍රිෂ්ණමූර්තිගේ ඉගැන්වීම්වල මූලික ලක්ෂණ සාකච්ඡා කරන්න.

07. නූතන විද්‍යාව හා සමහ මහායාන ධර්මයේ හා තාඕ ආගමේ ඇති සම්බන්ධතාව පිළිබඳ මහාචාර්ය ප්‍රිත්යොප් කප්රාගේ අදහස් සාකච්ඡා කරන්න.

08. පහත සඳහන් මාතෘකාවලින් තුනකට **(03)** කෙටි සටහන් සපයන්න.

   i. සික් ආගම
   ii. භගවත් ගීතාව
   iii. ගෝත්‍රික ආගම් (Tribal Religions)
   iv. යුදෙව් ආගම (Judaism)
   v. මාක්ස්වාදය හා ආගම
   vi. පුනර්භවය (Re-becoming)
   vii. ආගම හා විද්‍යාව (Religion and Science)

@@@@@@@

41